Library

Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. } HRC/AP/288/14 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2019-06-04

පැමිණිලිකරු : ඩබ්.ඩබ්.ආර් සංජීවනී ජයවර්ධන මිය.
අංක 42. දියවර ගම්මානය.
ඉලුප්පුකන්නිය.
මෙගොඩවැව.

අතෘප්තියට පත් අය : ඩබ්.එම්.අයි.එස් කුමාර මයා.

වගඋත්තරකරුවන් :

1. පො.ස - එච්.එච්.එස්.ආර්.කේ ද සිල්වා මයා.
   මූලස්ථාන පොලිස් ස්ථානය. - අනුරාධපුරය.

2. පො.සැ 57360 යූ දිසානායක මයා.
   පොලිස් ස්ථානය. - ගලෙන්බිඳුනුවැව.

3. පො.කො 51602 ජී.එම්.එන් හේරත් මයා.
   පොලිස් ස්ථානය. - මිහින්තලය.

4. ඊ.ජී.ඒ.ඩී කුමාර මයා.
   පොලිස් ස්ථානය. - හබරණ.

5. පො.කො 69016 ඒ.එම්.ඒ.කේ අබේසිංහ මයා.
   පොලිස් ස්ථානය. - මින්නේරිය.

6. පො.කො 48270 එච්.බී.එස්.එන් කුමාර මයා.
   පොලිස් ස්ථානය. - අනුරාධපුරය.

7. පො.කො 68494 ටී.එම්.ආර්.එස් තෙන්නකෝන් මයා,
   පොලිස් ස්ථානය - වැලිකන්ද.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

8. පො.කො 32236 කේ.එම්.ඩබ්.බී කීරවැල්ල මයා,
පොලිස් ස්ථානය - අනුරාධපුරය.

9. පො.කො 32211 එම්.සී.එස් දිසානායක මයා,
පොලිස් ස්ථානය - අනුරාධපුරය.

10. පො.කො 33913 පී.බී.යූ සේනාරත්න මයා,
පොලිස් ස්ථානය - කහටගස්දිගිලිය.

11. පො.කො 34416 ඩී.එම්.එන්.කේ දිසානායක මයා,
පොලිස් ස්ථානය - කැකිරාව.

12. පො.සැ 48319 එච්.එම්.අජිත් හේරත් මයා,
පොලිස් ස්ථානය - වව්නියාව.

13. පො.සැ 26852 එස්. විජේසිංහ මයා.
පොලිස් මුරපොල.
වත්කාල - මන්නාරම

පැමිණිලි අංකය : **HRC/AP/288/2014**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2014.05.11 වන දින අගතියට පත් ඩබ්.එම්.අයි.එස් කුමාර යන අය නිවසේ නිදා සිටියදී පෙ.ව 10.30 ට පමණ පොලිස් නිලධාරීන් දෙදෙනකු තම නිවසට පැමිණ ඇති බව බිරිඳ වන ඉහත පැමිණිලිකාරිය විසින් දන්වන ලද බවත්, එම අවස්ථාවේදීම පො.කො 34116 දිසානායක නිලධාරියා ඇඳ අසලටම පැමිණ ස්ථානාධිපතිතුමා පාරේ සිටින බවත්, ඔහු හමුවීමට පැමිණෙන ලෙසත් දන්වා සිටි අතර පසුව ඔවුන් දෙදෙනා තමාව යතුරු පැදියේ නංවාගෙන ඉලුප්පුකන්නිය නෙළුම්වැවට කැඳවාගෙන ගිය බවත්ය.

ඔහුව එම ස්ථානයට රැගෙන යන විට දිලිප් නොහොත් සුද්දා එම ස්ථානයේ සිටි බවත්, ඔහුගේ අත්දෙක පිටුපසට වන සේ මාංචු දමා සිටි බවත්, පොලිස් සැරයන් විජේසිංහ මහතා පැමිණිලිකරුට පහරදීමට සූදානම් වූ බවත් එම අවස්ථාවේද තමන්ට පහර දුනහොත් මානව හිමිකම් කොමිසමට දැනුම් දෙන බව පැවසීමෙන් පසුවද පහරදුන් බවත් සඳහන් කර ඇත.

පසුව නැවතත් ඩබ්.එම්.අයි.එස් කුමාර යන අයව නිවසට රැගෙන විත් WPPU 6841 දරණ ලොරි රථය නිවසින් එළියට ගන්නා ලෙස පොලිස් නිලධාරීන් විසින් දැනුම්දුන් බවත් පසුව ලොරි රථයද රැගෙන හල්මිල්ලෑවේ සමන්ත යන අයගේ ගෙදරට ගෙන ගිය බවත්. එම අවස්ථාවේදී පොලිස් සැරයන් විජේසිංහ යන අය පැමිණිලිකරුගේ මහපට ඇඟිල්ල අනෙක් පසට දැඩි ලෙස නමනු ලැබූ බවත් දක්වා ඇත.

සමන්ත යන අයගේ නිවසට රැගෙන ගොස් සමන්තලාගේ නිවසින් ගත් ගංජා ග්‍රෑම් 750 ක ප්‍රමාණය නගරයේ ඇති නිරෝගා නම් සිංහල බෙහෙත් බඩු කඩයෙන් කොටස් දෙකකට බෙදා කිරා සමන්ත යන අයට ගංජා ග්‍රෑම් 215ක් හා පැමිණිලිකරුට ග්‍රෑම් 535ක ප්‍රමාණයක්ද දමා පොලිස් නිලධාරීන් විසින් ලියන ලද ප්‍රකාශයකට අත්සන් කරන ලෙස දැන්වූ බවත් එම ප්‍රකාශය කියවීමට අවස්ථාව ලබා නොදී අත්සන් කරන ලෙස දැන්වූ බවත්. එම ප්‍රකාශයට අත්සන් කළ බවත් දක්වා ඇත.

බන්ධනාගාරගත කළ පසු බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරයා විසින් පොලිස් සැරයන් විජේසිංහ මහතා විරුද්ධ අතට නමනු ලැබූ මාපට ඇඟිල්ල සඳහා ප්‍රතිකාර ලබාදුන් බවත්. වගඋත්තරකරුවන් නීත්‍යානුකූල නොවන අයුරින් අත්අඩංගුවට ගෙන තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින් පරීක්ෂණයක් සිදුකර සාධාරණය ඉටුකර දෙන ලෙසත් පැමිණිලිකරු ඉල්ලීමක් කර ඇත.

වගඋත්තරකරුගේ ප්‍රකාශය :-

කොමිෂන් සභා පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. පැමිණිලිකරු වන ඩබ්.එම් ඉන්දජිව සරත් කුමාර යනඅය ගංජා විකුණන බවට 2014.05.11 වන දින උදෑසන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ විශේෂ ඒකකය වෙතින් ලද තොරතුරකට අනුව එම තොරතුර සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරයා දැනුවත් කර නිලධාරී කණ්ඩායමක් සමඟ අදාළ වැටලීම් රාජකාරි සඳහා පැය 10.50ට ස්ථානයෙන් පිටව ගිය බවත්ය.

පුද්ගලික ඔත්තුකරුවෙකු විසින් ලබා දුන් තොරතුරට අනුව මෙම පැමිණිලිකරු ඔහුට අයත් WPPU 6841 දරණ ලොරි රථයෙන් ගලෙන්බිඳුනුවැව සිට ඉලුප්පුකන්නිය දෙසට ගංජා ප්‍රවාහනය කරන බැවින් මෙම තොරතුර පරීක්ෂා කිරීම සඳහා ඉලුප්පුකන්නිය ධීවර ගම්මානයට හැරෙන හන්දියේ ක්ෂණික මාර්ග බාධකයක් ලෙස පොලිස් නිලධාරීන් යොදවා ගලෙන්බිඳුනවැව සිට ඉලුප්පුකන්නිය දෙසට එන වාහන පරීක්ෂා කළ බවත්. එම අවස්ථාවේදී WPPU 6841 දරණ වාහනය පැමිණි බවත්. මෙහිදී අදාළ වාහනය පොලිස් පරීක්ෂක හර්ෂ ද සිල්වා යන නිලධාරීවරයා විසින් පරීක්ෂා කළ බවත්. පරීක්ෂා කරන අවස්ථාවේදී රියදුරු අසුන යට තොරතුරේ සඳහන් ආකාරයට නීති විරෝධී ගංජා පාර්සලයක් තිබූ බවත් දක්වා ඇත.

සියලු පරීක්ෂාවන්ගෙන් අනතුරුව 2014.05.11 වන දින පැය 15.40 ට ගංජා නීති විරෝධී ලෙස ප්‍රවාහනය කිරීමේ වරද කියාදී අංක 42. දියවර ගම්මානය. ඉලුප්පුකන්නිය පදිංචි වනසිංහ මුදියන්සේලාගේ ඉන්දජිව සරත් කුමාර යන අය අත්අඩංගුවට ගෙන ගලෙන්බිඳුනුවැව පොලීසිය වෙත ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

පැමිණිලිකරුට එරෙහිව බලපත්‍ර නොමැතිව නීති විරෝධී ගංජා ග්‍රෑම් 535 ක් අංක WPPU 6841 දරණ ලොරි රථයෙන් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් අංක බී 1455/2014 යටතේ කහටගස්දිගිලිය ගරු අධිකරණයට කරුණු වාර්තා කරන ලද බවත් වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත.

මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය අනුරාධපුර මඟින් වර්තාවක් කැඳවා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, 2014.05.11 වන දින පෙ.ව 11.00 ට පමණ තමන් නිවසේ නිදා සිටියදී පොලිස් නිලධාරීන් තම නිවසට පැමිණ තමන්ව එළියට රැගෙනවිත් ඔවුන් පැමිණි යතුරු පැදිවල නංවාගෙන රැගෙන ගොස් නීති විරෝධී ගංජා ප්‍රවාහනය කළ බවට චෝදනා කර අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කරමින් අසාධාරණයක් සිදුකර ඇති බවයි.

මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු විසින් නීති විරෝධී ගංජා විකුණන බවට ලද තොරතුරකට අනුව කරන ලද වැටලීමේදී පැමිණිලිකරු WPPU 6841 දරණ ලොරි රථයෙන් ගංජා ප්‍රවාහනය කරමින් සිටියදී නීත්‍යානුකූල ලෙස අත්අඩංගුවට ගත් බවත් අත්අඩංගුවට ගත් පසු පැමිණිලිකරුට කිසිදු පහරදීමක් නොකළ බවත් ය.

මෙම පැමිණිලිකරු 2014.05.11 වන දින පෙ.ව 10.30 ට පමණ නිවසේ නිදා සිටියදී වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගෙන යතුරුපැදිවල නංවාගෙන ඉලුප්පුකන්නිය නෙළුම්වැට ගෙන ගිය බව දක්වන අතර මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා ඉලුප්පුකන්නිය ධීවර ගම්මානය මෙගොඩවැව පදිංචි ගම්වාසීන් 78 දෙනකු විසින් අත්සන් කරන ලද පෙත්සමක් පැමිණිලිකරු විසින් කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.

එම පෙත්සම මඟින් ගම්වාසීන් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරු නිවසේ නිදාගෙන සිටියදී නිවසට පැමිණි පොලිස් නිලධාරීන් ඔහුව නින්දෙන් නැගිටවාගෙන ගොස් නැවත ඔහුගේ නිවසට පැමිණ ඔහුට අයත් ලොරි රථය එළියට ගෙන පොලිස් නිලධාරීන්ට අවශ්‍ය පමණ ගංජා දමා පැමිණිලිකරු නොකළ වරදකට හසුකර බන්ධනාගාර ගත කරන ලද බවයි.

පැමිණිලිකරුව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවට ඉදිරිපත් කර ඇති එකම සාක්ෂිය ඉහත පෙත්සම වන අතර, එම පෙත්සමේ සඳහන් කරුණු සලකා බැලීමේදී මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී මෙම පෙත්සමේ සඳහන් 78 දෙනාම පැමිණිලිකරු අත්අඩංගුවට ගත් ස්ථානයේ එම අවස්ථාවේදී සිටි බවට පැමිණිලිකරුගේ පැමිණිල්ලෙන් ඔප්පු කර හෝ සනාථ කර නොමැති හෙයින් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති මෙම සාක්ෂිය පිළිගැනීම ප්‍රශ්නගත වේ.

මෙම පැමිණිලිකරුව නීත්‍යානුකූලව අත්අඩංගුවට ගැනීමට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවට වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත කර ඇති ප්‍රකාශයන් හා පැමිණිලිකරු විසින් තමන්ව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවට කොමිසම වෙත ලබා දී ඇති ප්‍රකාශවලට අදාළ ලේඛන නිරීක්ෂණය කිරීමේදී පැමිණිලිකරුව වගඋත්තරකරුවන් විසින් නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවට ඔප්පු කළ හැකි කරුණු පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර නොමැති හෙයින් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවන් තුළින් පැමිණිලිකරුගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13 හි සඳහන් අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට නිගමනය කිරීමේ හැකියාවක් නොමැති බැවින් එම තීරණය බැහැර කරනු ලැබේ.

පැමිණිලිකරුට වගඋත්තරකරුවන් පහරදුන් බවට ප්‍රකාශයක් කර ඇති හෙයින් පැමිණිලිකරුට අදාළ වෛද්‍ය වාර්තාව අනුරාධපුර බන්ධනාගාරය වෙතින් ලබාගෙන ඇත.

පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, පො.සැ 26852 එස්. විජේසිංහ මහතා විසින් තමන්ට පහරදුන් බවට වන අතර පහර දුන් ආකාරය සම්බන්ධයෙන් විස්තර කිරීමේදී එම නිලධාරියා විසින් පැමිණිලිකරුගේ අතෙහි මහපට ඇඟිල්ල අනෙක් පසට දැඩි ලෙස නමන ලද බවට දක්වා ඇති අතර, කොමිෂන් සභාව වෙත ලැබී ඇති වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරුගේ දකුණු අතෙහි මහපට ඇඟිල්ලෙහි තුවාලයක් සිදුව ඇති බවට හා ඒ සඳහා ප්‍රතිකාර ලබා දී ඇති බවට දක්වා ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරු දක්වන වධහිංසා කළ ආකාරය හා සිදුවූ තුවාල සැසඳේ. එසේම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන උපසේවකට බාරදීමේදී එවැනි තුවාලයක් තිබූ බවට සටහන් යොදා නොමැත. එබැවින් එම තුවාලය අත්අඩංගුවෙන් පසුව සිදුවූ තුවාලයක් බවට නිගමනය කළ හැක.

ඒ අනුව ලැබී ඇති වෛද්‍ය වාර්තාව අනුවද ඉදිරිපත්ව ඇති කරුණු අනුවද ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාවක් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ සඳහන් 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. 13 වන වගඋත්තරකාර පොලිස් සැරයන් විජේසිංහ යන අය විසින් පැමිණිලිකරුට රු.5,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

2. වගඋත්තරකරු සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

2019.07.15 දිනට පෙර මෙම නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත:- පොලිස්පතිතුමා.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

B/

සැ.යු :- අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.